ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
අධ්‍යාපන පීඨය
අධ්‍යාපනවේදී නාට්‍ය හා රංගකලා ගෞරව උපාධි වැඩසටහන- 2023/2024
පස්වන මට්ටම
අවසාන පරීක්ෂණය 2024
**STU5518 - සෞන්දර්ය හා නිර්මාණාත්මක ක්‍රියාකාරකම්**
කාලය පැය තුනයි. (03)

---

දිනය - 2024.12.19 වේලාව - පෙ.ව.09.30 - ප.ව.12.30 දක්වා

---

1 වන කොටසේ සියලුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.

## 1 වන කොටස

01. සෞන්දර්ය යන්නෙන් අදහස් වන්නේ කුමක්දැයි ඔබේ වචනයෙන් කෙටියෙන් ලියා දක්වන්න.

02. "සෞන්දර්ය අධ්‍යාපනය" යන්න අර්ථ දැක්වීමට සුදුසු ඔබේ නිර්වචනයක් ගොඩනගන්න.

03. සෞන්දර්ය විෂයයක් ලෙස හැදෑරීමෙන් ශිෂ්‍යයා ලබන ප්‍රතිලාභ පහක් (05) දක්වන්න.

04. සෞන්දර්ය අධ්‍යාපනය හැදෑරීම මඟින් ගුරුවරයාට ලැබෙන ප්‍රතිලාභ පහක් (05) ලැයිස්තු ගත කරන්න.

05. ඉහත හතරවන (04) ප්‍රශ්නයට ඔබ දැක්වූ ප්‍රතිලාභ අතරින් එක් ප්‍රතිලාභයක් ගෙන ඒ පිළිබඳව කෙටි විස්තරයක් ඉදිරිපත් කරන්න.

06. භාවමය බුද්ධිය කෙටියෙන් හඳුන්වා, ඒ පිළිබඳව ඇති දැනුවත්භාවය ඉගැනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේ දී ගුරුවරයකුට වැදගත් වන්නේ කෙසේදැයි කෙටියෙන් පෙන්වා දෙන්න.

07. ප්‍රාථමික පන්ති කාමරය තුල නිර්මාණාත්මක ක්‍රියාකාරකම් සංවිධානය කිරීමේදී ගුරුවරයා විසින් සලකා බැලිය යුතු ප්‍රධාන අංග පහක් (05) නම් කර ඉන් එකක් කෙටියෙන් විස්තර කරන්න.

08. සමබර පෞරුෂයක් ගොඩනැගීමේදී සෞන්දර්ය විෂයෙන් ලැබෙන පිටිවහල කෙසේදැයි සාකච්ඡා කරන්න.

(ලකුණු 5x8=40)

## දෙවන කොටස

09. (i.) සාක්ෂරතාව සහ සෞන්දර්ය සාක්ෂරතාව අතර වෙනස කෙටියෙන් සංසන්දනය කරන්න. (ලකුණු 04)

(ii.) පූර්වසේවා ගුරුවරයෙක් වශයෙන් සූදානම් වීමේදී ශිෂ්‍යයන් තුළ සෞන්දර්ය සාක්ෂරතාව වැඩිදියුණු කිරීමට ඔබට ගතහැකි ක්‍රියාමාර්ග තුනක් **(03)** විස්තර කරන්න. (ලකුණු 06)

(iii.) පූර්වසේවා ගුරුවරයෙක් වශයෙන් ඔබට සෞන්දර්ය සාක්ෂරතාව පිළිබඳ දැනුම්වත්භාවය වැදගත් වන්නේ ඇයිදැයි සුදුසු නිදසුන් දෙකක් **(02)** ඇසුරින් පෙන්වා දෙන්න. (ලකුණු 10)

10. "පූර්ණ පෞරුෂයක් ගොඩ නැඟීමේදී සෞන්දර්ය අධ්‍යාපනයේ කාර්යභාර්ය අතිමහත්ය."

(i.) ඉහත කියමන 2006 වසරේදී යුනෙස්කෝව විසින් හඳුන්වා දුන් සෞන්දර්ය අධ්‍යාපනයේ ප්‍රධාන අරමුණු හතර **(04)** ඇසුරින් සාකච්ඡා කරන්න. (ලකුණු 10)

(ii.) වර්තමානයේ සෞන්දර්ය අධ්‍යාපනය පාසල් විෂය මාලාව තුළ පැවතිය යුතු ද, නැති ද යන්න මතභේදයක් පවතී. මේ පිළිබඳ ඔබේ අදහස දක්වන්න. අවශ්‍ය තැන්හී සුදුසු නිදසුන් ඉදිරිපත් කරන්න. (ලකුණු 10)

11. (i.) බහුවිධ බුද්ධි න්‍යායට අදාල බුද්ධි වර්ග නම් කරන්න. (ලකුණු 04)

(ii.) "ලොවින් එකෙක් එක් දෙයකට වෙයි සමත
වෙනින් අනෙක් දෙයකට අනෙකෙක් සමත" (සුභාෂිතය)

සුභාෂිතයේ මෙම කවිය බහුවිධ බුද්ධි න්‍යායට අනුව ඔබ ගලපන්නේ කෙසේදැයි අවම වශයෙන් නිදසුන් තුනක්වත් දක්වමින් සාකච්ඡා කරන්න. (ලකුණු 06)

(iii.) බහුවිධ බුද්ධි න්‍යායේ ඔබ කැමති බුද්ධි වර්ග දෙකක් (02) තෝරාගෙන, ඔබ විසින් තෝරා ගනු ලැබූ එම බුද්ධීන් සිසුන් තුළ සංවර්ධනය කිරීම සඳහා ඔබ විසින් යෝජනා කරන නිර්මාණාත්මක ක්‍රියාකාරකම් දෙකක් **(02)** සැලසුම් කරන්න. (පියවර වශයෙන් දක්වන්නේ නම් හොඳයි.) (ලකුණු 10)

12. (i.) භාවමය බුද්ධිය යන්න සුදුසු නිර්වචනයක් ඇසුරින් පහදන්න. (ලකුණු 04)

(ii.) සිසුන් තුළ භාවමය බුද්ධිය සංවර්ධනය කිරීමේදී සලකා බැලිය යුතු කරුණු මොනවාදැයි කෙටියෙන් පෙන්වා දෙන්න. (ලකුණු 06)

(iii.) චිත්තවේගී කළමනාකරණය කිරීමෙහිලා තම හැඟීම් සහ අන්‍යයන්ගේ හැඟීම් පිළිබඳ වඩාත් දැනුවත් වීමට සෞන්දර්ය ඉවහල් වන්නේ කෙසේදැයි පෙන්වා දෙන්න. (ලකුණු 10)

13. (i.) ළමා සංවර්ධනයේදී සෞන්දර්ය හා නිර්මාණාත්මක ක්‍රියාකාරකම් වැදගත් වන්නේ ඇයි දැයි සුදුසු නිදසුන් දෙකක් **(02)** ඇසුරින් පහදන්න. (ලකුණු 10)

(ii.) පහත දක්වා ඇති විෂයන්ගෙන් කැමති විෂයයක් තෝරාගෙන ශිෂ්‍යයාගේ නිර්මාණාත්මක බව මතු කිරීමට මෙන්ම පෞරුෂ සංවර්ධනයටද එම විෂය දායක වන්නේ කෙසේදැයි විමර්ශනය කරන්න.

1. චිත්‍ර 3. සංගීතය
2. නර්තනය 4. නාට්‍ය හා රංගකලාව (ලකුණු 10)

-හිමිකම් ඇවිරිණි.-